# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973 (HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1720/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 16/11/2024<br>පැය 0540 |


## මාධ්‍ය නිවේදනය

### 01. මනුෂ්‍ය ඝාතනයක් - සාලියවැව පොලිස් වසම.

2024.11.15 වන දින අළුයම් කාලයේ සාලියවැව පොලිස් වසමේ යාය 07 ප්‍රදේශයේදී නිවසකට ඇතුළු වී කාමරයේ දොර කඩා පුද්ගලයකුට පොලු වලින් පහර දී ඝාතනය කර ඇති බවට ලද පැමිණිල්ලක් අනුව විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 35 ක් වූ යාය 07, සාලියවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

2024.11.14 වන දින රාත්‍රී කාලයේ පැවති මත්පැන් සාදයකදී ඇති වූ බහින්බස් වීමක් දුර දිග යාමෙන් එම සාදයේ සිටි දෙදෙනෙකු නැවත පැමිණ මෙම පහරදීම සිදුකර ඝාතනය සිදු කර ඇති බවට අණාවරනය වී ඇත.

අපරාධයට සම්බන්ධයෙන් අවුරුදු 23 හා 24 වයස්වල පසුවන සාලියවැව ප්‍රදේශයේ පදිංචි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත. මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදු කර පුත්තලම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සාලියවැව පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

### 02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - උඩවලව පොලිස් ස්ථානය.

2024.11.15 වන දින උදෑසන කාලයේ උඩවලව පොලිස් වසමේ මහආර ප්‍රදේශයේදී උඩවලව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 44 වන මහාආර, උඩවලව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

උඩවලව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොටවෙහෙර පොලිස් ස්ථානය.**

2024.11.15 වන දින දහවල් කාලයේ කොටවෙහෙර පොලිස් වසමේ අහුබොඩගම ප්‍රදේශයේදී කොටවෙහෙර පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 වන කොටවෙහෙර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොටවෙහෙර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. යතුරු පැදියක් දුම්රියේ ගැටී පුද්ගලයෙකු මියයාම - හබරණ පොලිස් වසම.**

2024.11.15 වන දින දහවල් කාලයේ හබරණ පොලිස් වසමේ හබරණ බෙල්ලන්කඩවල අතුරු මාර්ගයේදී මඩකලපුව සිට කොළඹ කොටුව බලා ධාවනය වූ උදය දේවී දුම්රියේ යතුරු පැදියක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පසුපැදිකරු මියගොස් ඇති අතර, පැදිකරු බරපතල තුවාල ලබා දඹුල්ල රෝහලට ඇතුලත් කර ඇත.

**මරණකරු වයස අවුරුදු 69 ක් වූ කිනිහිරිගම, කැකිරාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය දඹුල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. හබරණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. ලොරි රථයක් දුම්රියේ ගැටී පුද්ගලයන් දෙදෙනෙකු මියයාම - වැලිගම පොලිස් වසම.**

2024.11.15 වන දින සවස් කාලයේ වැලිගම පොලිස් වසමේ වැලිගම දෙනිපිටිය අතුරු මාර්ගයේදී අනතුරු හැඟවීමේ සංඥා ක්‍රියාත්මකව තිබියදී මාතර සිට ගාල්ල දෙසට ධාවනය වූ දුම්රියක කුඩා ලොරි රථයක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් රියදුරු, පිරිමි පුද්ගලයෙකු, කාන්තාවන් දෙදෙනෙකු සහ පිරිමි ළමුන් තිදෙනෙකු බරපතල තුවාල ලබා මාතර රෝහලට ඇතුලත් කිරීමේදී රියදුරු සහ පිරිමි පුද්ගලයා මියගොස් ඇත.

**මරණකරුවන් අවුරුදු 32 හා 82 වයස්වල පසුවන කිරිමැටිමුල්ල, තෙලිජ්ජවිල ප්‍රදේශයේ පදිංචිකරුවන් වන අතර, පියා සහ පුතා වේ.**

මෘත ශරීර මාතර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මියගිය රියදුරුගේ බිරිඳ, මව, දරුවන් දෙදෙනා සහ ඥාති පුතෙකු තුවාල ලැබූවන් අතර සිටී. වැලිගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. මාරක රිය අනතුරක් - සීදූව පොලිස් වසම.**

2024.11.15 වන දින රාත්‍රී කාලයේ සීදූව පොලිස් වසමේ කොළඹ මීගමුව මාර්ගයේ 20 කණුව ප්‍රදේශයේදී කොළඹ දෙස සිට මීගමුව දෙසට ධාවනය වූ වාහනයක මාර්ගය අයිනේ ගමන්කළ පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පදික පුද්ගලයා බරපතල තුවාල ලබා මීගමුව රෝහලට කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 79 ක් වූ කඳවල, දෙමංහන්දිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මීගමුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරින් පසු සැකකරු පලා ගොස් ඇති අතර, ඔහු අත්අඩංගුවට ගැනීම සඳහා සීදූව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**